# පැරණි සපරගමුව සහ එහි අගනුවර

## කලුවාණේ ජයසේකර

වර්‍ෂ 1889 දි ප්‍රතිස්ථාපනය කරන ලද සබරගමු පළාත ශ්‍රී ලංකාවේ පළාත් නවයෙන් මුහුදු වෙරළක් අහිමි රට අභ්‍යන්තරයෙහි ම පිහිටි ප්‍රදේශයක් වශයෙන් හඳුන්වා දිය හැකිය. රත්නපුර සහ කෑගල්ල යන දිස්ත්‍රික්ක දෙකෙන් සමන්විත මෙහි එම නම් වලින් ම දක්නා ලැබෙන ප්‍රධාන උප නගර දෙකක් පිහිටා ඇත. ආරම්භයේ දී කච්චේරි හෙවත් දිසාපති කාර්යාල දෙකකින් පාලනය වූ මෙම පළාත වර්‍තමානයෙහි සබරගමු පළාත් සභාව මඟින් පාලනය වෙයි. දිඝී ඉතිහාසයකට හිමිකම් පෙන්වන මෙකී බිම් කඩෙහි සීමාවන් කලින් කල වෙනස් වූ අතර, අතීතයේ දි සරගමුව නමින් හැඳින්වී ඇත්තේ වත්මන්හි කෝරළයකට අයත් භූමි ප්‍රමාණයකට වැඩි නොවන කොටසක් බව ද කිව යුතුය. මෙම කෙටි ලිපියෙන් සාකච්ඡා කිරීමට අපේක්‍ෂා කරනුයේ අතීත සපරගමුව හා එහි ප්‍රධාන නගරය හෙවත් අගනුවර වරින් වර වෙනස් වූ ආකාරය පිළිබඳවත්ය.

අගනුවර පිළබඳව විමසීමට ප්‍රථම සපරගමුව පිළිබඳ මූලික කරුණු කීපයක් ගැන සැලකිලිමත් වීම මැනවැයි හැඟේ. වර්‍තමාන ව්‍යවහාරයෙහි සබරගමුව පළාත වශයෙන් දක්වා ඇතත්, ඈත අතීතයෙහි සිට මෙම පෙදෙස හඳුන්වා ඇත්තේ සපරගමු, යන නමින් බව විවිධ ඓතිහාසික සාධක වලින් හෙළිවේ. දීප වංශය, මහා වංශය ආදි අපේ පැරණි වංශ කථාවල සපරගමුව ගැන සඳහන් නොවේ. එතකුදු වුවත් බුදුලෙන ලෙන් දොර ආදි සන්නස්වල, "සඵරග්ග්‍රාම," හා "සපරක්ග්‍රාම" යනුවෙන්ද, පරංගි ලේඛනවල "සඵරග්ග්‍රාහම" යනුවෙන්ද ඕලන්ද ලියවිලිවල, සඵර්ග්‍රාම්, යනුවෙන්

ද සඳහන් වන බව පෙනේ[1] මහා වංශය පරිවර්තනය කළ විල්හෙල්ම් ගයිගර් පඬිවරයාද එය "සචරග්‍රාම් රට්ය" හා "සචර්ගම්" යනුවෙන් ද දක්වා ඇත[2]. පශ්චාත් කාලීන වංශකථාවක් වූ දළදා වංශයේ ද සඳහන් වන්නේ "සපරග්‍රාම රට්ය" යනුවෙනි[3]. එසේම ඉංග්‍රීසි පාලන සමයේ මුල් අවධියේ දී මුරුසියේ සිරගත කළ ඇහැළේපොල මහ අදිකාරම් තුමා යටත් විජිතභාර මහලේකම් වෙත යැවූ ලිපිවල ද සඳහන් වනුයේ "සපරගමුව" යනුවෙනි[4].

"සපරගමුව" හෝ සබරගමුව නම ඇතිවීම පිළිබඳව ද වියතුන් අතර විවිධ මත පවතින බව පෙනේ. ඉන් සමහරක් ජනප්‍රවාද වේ. ලංකාපුරයේ දි ඇති වූ රාම රාවණ යුද්ධයේ දි රාම කුමරු එවූ හි සරය දෙතනගල කන්ද කපා ගෙන විත් වර්තමාන සමන් දේවාලය පිහිටි භූමියේ තිබූ කළු හබරල අලයක ඇමිණී නතර වූ බවත්, ඒ නිසා මෙම පෙදෙස "හබරගමුව" වී සබරගමුව වී යයි ජන කථාවක එයි. මෙය මිත්‍යා මතයක් ලෙස සම්පූර්ණයෙන් ම බැහැරලිය හැකි වුවද දෙවන පැරකුම් රජු සමයේදි (ක්‍රි.ව. 1236 – 1270) ආර්යකාමදේව අමාත්‍යවරයාගේ මෙහෙයීමෙන් සමන් දේවාලය ගොඩ නැගීමට මෙම භූමියම තෝරා ගැනීම අතීත සම්බන්ධතාවක් මත ඇති වූවකැයි සිතිය හැක. ලංකාජනතාව නමැති ග්‍රන්ථය සම්පාදනය කළ ආචාර්ය නන්දදේව විජේසේකර මහතා විජය රජු විසින් නෙරපන ලද කුවේණී සහ දරු දෙදෙන පලා විත් විසුවේ සබරගමුවේ බවත්,

---

1 සපරගමු දර්ශන පිට 2 පණ්ඩිත කිරිඇල්ලේ ඤාණවිමල හිමි

2 සාහිත්‍ය විශේෂ කලාපය, 60 පිට සංස්කෘතික දෙපාර්තමේන්තුව 1991

3 සීතාවකපුර යුගය 43 පිට - වේරහැර ආරියවංශ හිමි

4 ඇහැලේපොල මහ නිලමේ 79 පිට - නුවරඑළියේ හේමපාල

මෙම පළාතෙහි පිහිටි ග්‍රාමයක් වන වැද්දගලදී මෙහි විසූ අන්තිම වැද්දා මරා දැමූ බවත් සබරගමුව යනු වැද්දන් විසූ ප්‍රදේශය යන අරුත් දෙන බවත්, සඳහන් කරයි[5]. තව දුරටත් කරුණු දක්වන හෙතෙම වැද්දගලට නුදුරින් "පොතුපිටිය" නමින් ගමක් ඇති බවත් එහි ජනයා රිටිසුඹුළු ඇඳ සිටි බවත් එය පරෙවි සංදේශයේ (25 පද්‍යයෙහි) සඳහන් වන බවත් සඳහන් කරයි. සපරගමුවට දුන් අරුත මෙන්ම පොතුපිටිය ගැන දක්වන කරුණු ද සාවද්‍ය බව කිව යුතුය. පරෙවි සන්දේශයේ සඳහන් පොතුපිටිය පානදුර අසල පිහිටි පොතුපිටිය බවත් පරෙවියේ ගමන් මාර්ගය මුහුදු බඩ මාර්ගය බවත් අමුතුවෙන් කිවයුතු නොවේ. අප මෙහි දී අවධාරණය කරනුයේ සපරගමුවේ වැද්දන් නොසිටි බව නොවේ. වැද්දන්ගේ පෙදෙස යන අරුතින් "සපරගමුව" ඇති නොවූ බවය. මොණරාගල දිස්ත්‍රික්කයේ මහවැදිරට කෝරළේ නමින් පෙදෙසක් ඇත. දකුණු පළාතේ හබරාදූව ද වැද්දන්ගේ දූපත යන අරුත ඇති නාමයකි. කොහොඹා කන්කාරියේ[6] වැද්දන්ට හඬගැසීමේ කොටසේ දක්වෙන ගම් සපරගමුවට පමණක් අයත් ඒ වාද නොවේ. මේ අනුව ආචාර්ය නන්දදේව විජේසේකර මතය පිළිගැනීම විදුහුරු නොවන බව කිව යුතුය.

පුරා විද්‍යාඥයන්ගෙන් වැඩිපුර එළියක් නොලැබූ සපරගමු ඉතිහාසය මඳක් හෝ මතු කරන ලද්දේ පණ්ඩිත කිරිඇල්ලේ ඥාණවිමල හිමියන් විසිනැයි සිතමි. එතුමන්ගේ "සපරගමුවේ පැරණි ලියවිලි හා සපරගමු දර්ශන" නැමැති ග්‍රන්ථද්වය මගින් වඩාත් තර්කානුකූල අදහස් ඉදිරිපත් කොට තිබේ. උන් වහන්සේ පවසන අන්දමට සපරගමුව යන නාමය ඇතිවූයේ විදේශීය මූලයක් මත බව පෙනීයයි.

---

5 ලංකා ජනතාව 56 පිට ආචාර්ය නන්දදේව විජේසේකර
6 කොහොඹා කංකාරිය 90 පිට ආචාර්ය චාල්ස් ගොඩකුඹුර (සංස්කරණය)

හිබෲ භාෂාවෙන් SAPAR සපර් යයිද ලතින් භාෂාවෙන් SAPPHIRUS සැපිරස් යනුවෙන්ද ඉංග්‍රීසි භාෂාවෙන් SAPPHIRE සැපයර් යයිද භාවිත වේ. ක්‍රි:පූ: තුන්වන සියවසේදී මහා ඇලෙක්සැන්ඩර් අධිරාජයා ඉන්දියාව ආක්‍රමණය කළ අවස්ථාවේ ලක්දිවට ආ පිරිස් රත්නපුර පෙදෙසේ ගෙන් ගෙට ගොස් සපර්! සපර්!! යයි මැණික් ඉල්ලූ බව ද ජනප්‍රවාදයේ ඇත. මහා ඇලෙක්සැන්ඩර් සිරිපා නැමදීමට ගිය බවට ද මතයක් පවතී[7]. ඉහත සඳහන් කරුණු අනුව නිල් මැණික් ඇතුළු විවිධ මැණික් නිසා මෙය "සපරගම" වී පසුව සබරගමුව වී යැයි සිතිය හැකි.

ප්‍රාග් ඓතිහාසික යුගයේදී සපරගමුවේ ජනතාවක් විසූ බව සිතීමට අනුබල දෙන සාධක රත්නපුර අවට මැණික් පතල්වලින් හමුවූ හිපපොටේමස් සත්වයාගේ පාෂාණීභූත ඇටසැකිලිවලින් හෙළිවේ. සණ ඇස් බැමි සහිත මනුෂ්‍ය වර්ගයක් වශයෙන් සැලකිය හැකි "හෝමන් සිංහලෙයුස්" වර්ගය ලක්දිව් ආදිම ජන කොටස ලෙස හැඳින්විය හැකි බව් දැරණියගල මහතා පවසයි. පැරණි ශිලා යුගයට් අයත් මෙම නෂ්ටාවශේෂ ලැබී ඇත්තේ මෙම ප්‍රදේශයෙන් බැවින් මෙය රත්නපුර සංස්කෘතික යුගය ලෙස හැඳින්වේ[8]. මෙම යුගයේ රත්නපුර ප්‍රදේශයේ එක් ප්‍රධාන මධ්‍යස්ථානයන් දක්විය නොහැකි වුවද රත්නපුර බලංගොඩ හා කුරුවිට ඉහත කී ජනතාව් විසූ පෙදෙස් ලෙස දක්විය හැකියි.

මහාවංශයේ සබරගමුව හෝ රත්නපුර ගැන සඳහන් නොවේ. එහි මෙම ප්‍රදේශයේ ස්ථාන නාමයක් ලෙස දක්වෙන්නේ "සුමන කූටය" පමණි. බුදුන් වහන්සේ

---

7 ඓතිහාසික රත්නපුර 75 පිට බන්දුල ලියනගේ

8 සබරගමු සුහරාව 60 පිට රත්නපුර ප්‍රාදේශීය කලා මණ්ඩලය

ලක්දිවට තුන් වරක් වැඩම කළ බවත්, තුන්වන ගමනේදී සුමන සමන් දෙවියන්ගේ ආරාධනයෙන් සමන්ගිරට වැඩ ස්වකීය වාම ශ්‍රීපාද ලාංඡනය එහි පිහිටවූ බවත් මහා වංශයේ දැක්වේ[9]. ඉතිහාසය හෝ පුරාවෘත්ත අනුව සපරගමුව යම්කිසි පාලනයකට නතු කළ ප්‍රථමයා රාවණ බවත්, ඔහුගේ චන්ද්‍රගිරි රාජධානිය අනෙකක් නොව සපරගමුව බවත් ඇතැම් වාර්තාවක එයි[10]. එතකුදු වුවත් අපේ වංශ කථාවේ නිශ්චිත ස්ථානයක් හඳුනා ගත හැක්කේ බුදුන්ගේ ලංකාගමනයෙන් පසුව බව කිව යුතුය. මහා වංශයේ සමන් දෙවියන් හඳුන්වා ඇත්තේ මහා සුමන යන නමින්ය. ඔහුගේ දේව රාජ්‍යය සමන්තකූටයේ සිට මහියංගනය දක්වා පැතිර පැවතුණි. ප්‍රාග් බෞද්ධ දෙවියකුව වූ මොහු සමහර විට කලින් යක්ෂයකුව සිට බුදුන් වැඩීමෙන් පසුව (සෝවාන් වූ) දෙවියකු දැකිය හැක. ආටානාටිය සූත්‍රයේ සුමන නම් යක්ෂයකු ගැන දැක්වේ[11]. සපරගමු සමන් දේවාල පෙරහැරේ ගෙන යන, "මහබඹා" කෝලමේ යක්ෂ සහ මිනිස් වශයෙන් මුහුණු දෙකක් ඇත. එය සමන් දෙවියන්ගේ ද්වි ස්වභාවය මිස සපරගමුවේ මිනිසුන්ට ඇතැයි ඇතමුන් සලකන මුහුණු දෙක නොවේ. මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීහු සමන් දෙවියන්, "යම දේවතාව," ලෙස හඳුන්වති. ඔහු කවරකු වුවත් ඔහුගේ පාලන මධ්‍යස්ථානය වූයේ මෙම සපරගමුවයි.

අනුරාධපුර යුගයේදී (ක්‍රි: පූ: 543 – ක්‍රි: ව: 1029) සපරගමුව හෝ රත්නපුර ගැන කිසිදු අභිලේඛනයක නොදැක්වේ. එහෙත් මෙම පෙදෙස නිශ්චිත වශයෙන්ම ත්‍රි සිංහලයේ මායාරටට අයත් විය. වරෙක මෙය පරසතුරු උවදුරින් නායකයන් බේරීමට පළා ආ

---

9 මහාවංශය පරි. 01 ගථා 77, 78

10 ඓතිහාසික රත්නපුර 8 පිටුව

11 දීඝ නිකාය ආදානාටිය සූත්‍රය

සරණ ස්ථානයක් විය. "මලය දේශය" නමින් ද හැඳින්වූ කොටසට මෙය ද අයත් විය. වළගම්බා රජු (ක්‍රි.පූ. 103–77) සපරගමුවේ විවිධ ගල්ලෙන් තුළ සැඟවී සිටි බව විවිධ ජනප්‍රවාදයන්හි එයි. අටුවා පොත් අනුව එකල මලය දේශය (බැම්නිවියා සාය වැනි) අවධින්හිදී ද ආහාරපාන සුලභ පෙදෙසක් විය. අනුරපුර යුගයේදී මෙම සපරගමුවට අයත් හදගරිය, සංඛපාල, බුදුලෙන, ගල්පාය වැනි ස්ථාන ගැන සඳහන් වෙයි[12]. මෙම ප්‍රදේශවල සෙල්ලිපි ඇත. එබැවින් එම වකවානුව තුළද විසිර ගිය ජනතාවක් මෙහි වාසය කළ බව සිතිය හැකිය. එහෙත් ප්‍රධාන ගමක් හෝ නගරයක් ගැන අසන්ට නොලැබේ. ඇතැම් විට මහා සුමන දෙවියන්ගේ දේව රාජ්‍යයේ අනුප්‍රාප්තිකයන් සමන්තකූටයට ආසන්න ගිලිමලය, පලාබද්දල වැනි ස්ථානයක මූලස්ථානයක් ගොඩනගා ගන්නටද ඇති. පොළොන්නරු යුගයේ දී (ක්‍රි.ව.1029-1236) සපරගමුවේ විවිධ ස්ථාන ගැන සඳහන් වන ඓතිහාසික සාධක දක්නට ලැබේ. 1වන විජයබාහු රජතුමා (ක්‍රි.ව. 1055–1110)[13] කුරුවිට, එරත්න, ගිලිමලය හරහා ශ්‍රී පාදය වන්දනා කොට සිරිපා මළුවට නඟින වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස ගිලිමලය හා බමරබොටුව යන ගම් දෙක ශ්‍රී පාදස්ථානයට 'පූජාකොට ගිලිමලයේ සෙල්ලිපියක්ද පිහිටුවිය. ඉන් පසුව 1 වන පරාක්‍රමබාහු රජතුමා ද සිරිපා නැමද බැතිමතුන් සඳහා පහසුකම් සැලසීය. මෙයින් පැහැදිලි වන එක් කරුණක් නම් ශ්‍රී පාදය මුල් කොට ගිලිමලය අවට ප්‍රදේශයට විශේෂ ස්ථානයක් හිමිවූ බවය. මේ හැර මහා පරාක්‍රමබාහු රජතුමා රුහුණු රට යටත් කොට දළදාව සහ පාත්‍ර ලබා ගැනීම සඳහා සුගලා බිසව සමඟ කළ දැවැන්ත අරගලයේදී රුහුණට සේනාව රැගෙන ගිය ද්‍රවිඩාධිකාරි රක්ඛ ගමන්

---

12 සාහිත්‍ය විශේෂ කලාපය 8 - 9 පිටු

13 මහාවංශය 52 පරි. ගාථා 63, 64

කොට ඇත්තේ ගිලිමලය බමරබොටුව හරහා කිරිබත්ගල කඳුවැටිය අසළ තැනිතලාව ඔස්සේ දෙණවකට ගොස් බව ද ඓතිහාසික සාධක අනුව පෙනේ. යුද්ධයකදී සේනාව ගමන් කරන්නේ ආහාරපාන නැවතුම් පහසුකම් ඇති ස්ථාන ඔස්සේය.

එබැවින් මෙම කාලය වන විට ගිලිමලය ආශ්‍රිත ප්‍රදේශය ආර්ථික දියුණුවක් ලබා තිබූ බව සිතිය හැක. එසේම සියවස් ගණනක් ඉදිරියට පැවතුන පලාබද්ගල ආරණ්‍ය සේනාසනය ද මෙකල පොළොන්නරුවේ පවතින්නට ඇති බව - එය දඹදෙණි කාලයේදී දියුණුව පැවති තත්වය අනුව - එය කෙමෙන් වූ දියුණුවක් බවද නිගමනය කළ හැකිය. මේ අනුව පොළොන්නරු යුගයේ දී පලාබද්ගල සපරගමුවේ ප්‍රධාන නගරය බවට පත්වී තිබෙන්නට ඇත.

දඹදෙණි යුගයේදී සපරගමුවේ සංවර්ධන කටයුතු ගැන නැවත අසන්නට ලැබේ. දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ (ක්‍රි.ව. 1236 – 1271) කාලයෙහි සමනල අඩවියෙන් බැහැර පිහිටි සමන් දෙවොලක් ගැන ප්‍රථම වරට අසන්නට ලැබේ. මෙම රජතුමාගේ අමාත්‍යයෙකු වූ ආයසීකාමදේව සපරගමුවේ මැණික් ගැරීම සඳහා සමන් දෙවියන්ට වූ බාරයක් ඔප්පු කිරීම සඳහා දැනට සමන් දෙවොල තිබෙන (දේවාලේගම) ස්ථානයේ දෙවොලක් ඉදිකර දේවාභරණ වැඩමවා තේවාව කිරීමට නිලධාරීන් ද පත් කළේය[14]. මීට ප්‍රථම ශ්‍රී පාදස්ථානයට සම්බන්ධ සමන් දේවාලයක් පැවති බවත් එහි දේවාභරණ රජුගේ නියෝගය මත නව සමන් දෙවොලට වැඩම වූ බවත් අනාවරණය වේ[15]. මේ අනුව රත්නපුර

---

14 උඩරට කැරැල්ල තෙන්නකෝන් විමලානන්ද පිටු 418, 419

15 සපරගමු දර්ශනය 83 පිට

ප්‍රදේශයේ ඉදි වූ මුල්ම විහාරය වූ සමන් විහාරය සමන් දේවොල සමහම ඉදිවිය. මේ නිසා පලාබද්ගල ආරණ්‍ය සේනාසනය අභාවයට යාමෙන් අනතුරුව ප්‍රදේශයේ ධර්ම ශාස්ත්‍රෝන්නතිය මෙ සමන් විහාරයට සම්බන්ධ පිරිවෙණින් සිදුවිය. දෙවන පරාක්‍රමබාහු රජු යටතේ පලාබත්ගලට වැඩි රාජානුග්‍රහයක් සමන් වෙහෙරට ලැබුණු බවට සාධක ඇත. සපරගමුවේ මැණික් ගැරීමට ආ ආයස්කාමදේව ප්‍රතිරාජයා නතරව සිටින්නට ඇත්තේද මෙහිය. මැණික් මුල් කොට ආර්ථික සංවර්ධනයකුත්, සමන් වෙහෙර හා සමන් දේවාලය නිසා ආගමික පුනර්ජීවනයකුත් ලැබීම නිසා දඹදෙණි කාලයේදී දේවාලේගම ප්‍රදේශයේ ප්‍රධාන නගරය වූවාට කිසිදු සැකයක් නැත. එහෙත් මේ කාලයේදී ද සපරගම සපරපුර හෝ රත්නපුර ගැන අසන්නට නොලැබේ. සමහර විට මේ නම් කිපයම භාවිත වන්නට ඇත. ආයස්කාමදේව මැණික් සම්භාරයක් ගරා ගැනීම නිසා රත්නපුරය වූවා ද විය හැක. කෙසේ වෙතත් "රත්නපුර" නම මුල් වරට දක්නට ලැබෙන්නේ ගම්පොල යුගයේදිය.

කෝට්ටේ යුගයේ II වන පරාක්‍රමබාහු රජු සරණ පාවාගෙන සිටියේ කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් කිරවැල්ල පෙළපතට අයත් රංමැණිකා (ස්වර්ණමාණික්‍යා) නමැති කුමාරියකි. ඈ එහි විසූ රාජපුත්‍ර ඨකුර නමැති භාරතීය රජ පෙළපතකින් පැවත ආ ප්‍රදේශාධිපතියකුගේ දුවණියකි. හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් මාගම්පත්තුවේ අම්බලන්තොටින් සොයා ගත් සංස්කෘත සෙල්ලිපියක එම පෙළපත ගැන මෙන්ම "රත්නපුරය" ගැනද සඳහන් වේ. ඒ මෙසේය (හස්‍ය පුත්‍රස්තු රාජ්පුත්‍රස්‍ය රාජපුත්‍ර ඨකුරෝ ජාතිග්‍රමපුරේ පරක්‍රමබාහු රාජේත රෝහණං ප්‍රාප්‍ය ස්ථිබා පුරාග්‍ය භුමනෛතබාහු මහා රජස්‍ය මණ්ඩලිකොහුත්වා රත්නපූර රාජ්වනං කත්වා

සජීත්වා චෘතඃ තස්‍ය පුත්‍ර සතු රාජපුත්‍ර ඨකුරං පරාක්‍රමබාහු මහා රාජස්‍ය මණ්ඩලිකො හූත්වා[16]......,

මෙම සම්පූර්ණ සෙල්ලිපියෙන් ප්‍රකට වන්නේ හයවන පරාක්‍රමබාහු රජුගේ බිසව වූ ස්වර්ණමාණික්‍යා රාජපුත්‍ර ඨකුරක පරපුරට අයත් බවත්, දඹදෙණිපුර විදූ ඨකුර ආහින්ඩාල් පුරයේ සිට තුර්කීන්ට විරුද්ධව සටන් කොට පරාජිතව ලක්දිවට පළා විත් පස්වන විජයබාහු රජුගේ දියණියක විවාහ කරගත් බවත් ඔහුගෙන් ඇරඹි පරපුර ඨකුර පරපුර බවත්ය. ඒ අනුව හයවන ඨකුර පස්වන පරාක්‍රමබාහු රජ සමඟ (ආර්‍යචක්‍රවර්ති සමඟ කළසටනින් පරාජිතව) රුහුණට පළා ගොස් යළිත් රත්නපුරයට පැමිණ බුවනෙකබාහු රජුගේ ප්‍රදේශාධිපතියෙකු ලෙස කටයුතු කළ බවත්[17] ඔහුගේ පුත්‍රයා වූ රාජපුත්‍ර ඨකුර දැදිගම පාලකයා වූ අතර, ඔහුගේ දියණිය හයවන පාක්‍රමබාහු රජුගේ බිසව වූ බවත්ය.

මේ අතර ක්‍රි.ව. 1344 දි ලක්දිවට පැමිණි ඉබන් බතුතා ද ඇතැම් ඉතිහාසකරුවන් සඳහන් කරන පරිදි රත්නපුරය දැන සිටි බව කිව යුතුය. ආර්‍යචක්‍රවර්තිගේ උපකාර ඇතිව ශ්‍රී පාද වන්දනාවේ ගිය හෙතෙම මැණික් උපදින ප්‍රදේශයක පිහිටි "කෝනකර්" නැමැති නගරයක් ගැන සඳහන් කරයි. මෙය කුරුණෑගල, රයිගම හෝ රත්නපුරය විය හැකි යැයි ඉතිහාසඥයෝ මත පළ කරති[18]. එහෙත් මැණික් උපදින ප්‍රදේශය රත්නපුර මිස අනෙකක් නොවන හෙයින් මෙම නගරය රාජපුත්‍ර ඨකුර පාලනය කළ රත්නපුරය විය හැකියි. හයවන පරාක්‍රමබාහු රජ (ක්‍රි.ව. 1412 – 1462) සපරගමුවට

---

16 කෝට්ටේ පුරාණය 44 - 45 පිටු ඩග්ලස් රණසිංහ

17 **URC vxi, P 123**

18 ලංකා ඉතිහාසයේ පූර්ව තිරිතදිග යාමය 89 පිට කැලිස්ටස්

විශේෂ සැලකිල්ලක් දැක්වූ බව ඉතිහාසගතයි. මැණික් සම්පත නිසා රජ සපරගමුව කිසිදු අධිපතියෙකු වෙත නොපවරා තමන් සන්තකයේම තබාගත් බව සිතිය හැක. ගම්පොල යුගයේ දී රත්නපුර බලකොටුව ඉදිකළ රාජ පුත්‍ර ඨකුරගේ පරපුර දිගටම මෙහි වසන්නට ඇති බැවින් ඥාතීන්ගේ ප්‍රදේශයකට දක්වන සැලකිල්ලට මෙම ප්‍රදේශය පාත්‍ර වූවාද විය හැක. සවන පරාක්‍රමබාහු රජතුමා ස්වකීය මෑණියන් උදෙසා විහාර තුනක්ම ඉදි කළ අතර, ඉන් පළමුවැන්න පැපිලියානේ පිහිටි සුනේත්‍රාදේවි මහා විහාරය වේ. ඉතිරි දෙක පිහිටා ඇත්තේ සපරගමුවේය. ඒවා නම් අරමණපොල රජමහා විහාරය සහ තිවිතිගල සුනේත්‍රාදේවි රජමහ වෙහෙරයි[19]. තවද මෙම රජතුමා 11 වන පරාක්‍රමබාහු රජ දවස සපරගමුවට ආ අයසිකාමදේව ගේ මුණුපුරකු වන තිල පෙරුමාල් අමාත්‍ය වරයාට කළ නියෝගයක් අනුව සමන්වෙහෙර හා සමන් දෙවොල සංවර්ධන කටයුතු සඳහා 26000 ක ධනය වැය කළ බව ද සඳහන් වේ. මෙම විහාරස්ථානයේ පිරිත් දෙසුම පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙනේ මංගල හිමියන්ට පවරා තිබේ, එය සමන් දේවාල සෙල් ලිපියේ ද සඳහන් වේ.

හයවන පරාක්‍රමබාහු රජුගේ කාලයේදී වූ තවත් විශේෂ සිද්ධියක් නම් සපරගමු ප්‍රදේශයට ප්‍රාදේශිය කොඩියක් ලැබීමය. එය කහපාට කොඩියයි. දිවයින කලාප 12 කට බෙදූ මෙතුමා 5 වන දිසාව ලෙස සපරගමුව නම් කළේය. සමන් දේවාල සෙල්ලිපියට අනුව එකල සපරගමුව ලෙස ගැනුනේ ගිලිමලය. බඹරබොටුව සිට දෙණිවක දක්වා විහිද ගිය නව යොදුනක් පමණ වූ පටු බිම් තීරුවකි. මෙය නවයෝජන යනුවෙන් පොළොන්නරු යුගයේ සිට හැඳින්වූවද නව යෝජන නමින් අගනුවරක් නොවූ

---

19 සපරගමු දර්ශනය 190 - 191 පිටු

බවද සැලකිය යුතුය. ඉහත සඳහන් කළ සියලු කරුණු සලකා බැලූ විට අපට පැහැදිලි වනුයේ හයවන පරාක්‍රමබාහු රජ සමයේදී නව් යෝජන යේ අගනුවර වශයෙන් දේවාලේ ගම ප්‍රදේශය විශාල දියුණුවක් ලැබූ බවය.

හයවන පරාක්‍රමබාහු රජුගේ අභාවයෙන් පසුව කෝට්ටේ රාජධානියට අත් වූ අභාග්‍ය සම්පන්න ඉරණම සපරගමුව කෙරෙහි ද බලපාන්නට විය. හයවන විජයබාහු රජුගේ මරණය දක්වා සපරගමුවේ විශේෂ සිද්ධියක් නොවිය. විජයබා කොල්ලය නමින් හැඳින්වෙන විජයබා රජුගේ මරණයෙන් ඇරඹි අවිචාර සමයේදී (ක්‍රි.ව. 1534 න් පසුව) සපරගමුව ද ඉහත කී රාජ්‍ය ප්‍රාප්ත යුද්ධයේ මූලිකයා වූ මායාදුන්නේ කුමාරයාට අයත් විය. ඔහුට මුලින් අයත් වූ ප්‍රදේශ නම් දෙණවක සතර කෝරළය සහ සීතාවකයි. මේ දක්වා කෝට්ටේ රජු පාලනය කළ සපරගමුව මේ අනුව සීතාවක පාලනයට නතු විය. මේ කාලය තුළ දෙණවක ද ප්‍රාදේශිය නගරයක් වශයෙන් පැවති බවට විවිධ සාධක ඇත. එය රෝහණයට යන මාර්ගයේ පිහිටි වැදගත් නගරයක් වූවාද විය හැක. සීතාවක පාලකයා වූ මායාදුන්නේ සමඟ කෝට්ටේ රජු වූ හත්වන බුවනෙකබාහු රජු අතර පැවති යුද්ධවලදී 1505 දී මෙම රටට පැමිණ 1521 පමණ සිට බලවත් වූ පරංගි බුවනෙකබාහු රජුගේ ආරක්ෂාවට සිටීම මෙම ප්‍රශ්නය තවත් සංකීර්ණ වීමට හේතුවක් විය. බුවනෙකබාහු පරංගි උපකාර මත සීතාවක ආක්‍රමණය කළ එක් අවස්ථාවක පරාජිත වූ මායාදුන්නේ රත්නපුර අසල වූ බටුගෙදරට පලා ආයේය. රාජාවලියට අනුව බටුගෙදර මායාදුන්නේ රජ වර්ෂ තුනක් රැඳී සිටි නගරය විය. ඒ බව රාජාවලියේ "මායාදුන්නේ රජ්ජුරුවෝ බටුගෙදර තුන් අවුරුද්දක් වැඩ හිඳ කෝලිකට්ටුවෙන් වඩක්කරන් ගෙන්වා කුඩලිමරක් කලයන් ඇතුලු තිලමක්කාරයන් දෙන්නෙක් සහ

බොහෝ වඩක්කුවරුන් සීතාවකට ගෙන්වා යුද්ධය ආරම්භ කළාහ[20]" යනුවෙන් සඳහන් වේ. මේ අනුව මායාදුන්නේ බුවනෙකබාහුට විරුද්ධව කැලිකට් නගරයෙන් සේනා ගෙන්වා යුද්ධ ආරම්භ කළේ ද බටුගෙදර නගරයේ සිටයි. මේ කරුණු අනුව මෙම අවදිය වන විට රජුන්ගේ ආරක්ෂක ස්ථානයක් වූයේ දේවාලේගම නොව බටුගෙදරය. එසේ වුවද I රාජසිංහ රජුගේ අභාවය දක්වා ක්‍රි.ව. (1551–1593) දේවාලේගම දියුණු නගරයක්ව පැවති බවට සාධක නැත්තේ නොවේ.

පළමු වන රාජසිංහ රජුගේ අභාවයෙන් සීතාවක අරාජික විය. මේ අවධියේදී පරංගි සපරගමුව ආක්‍රමණය කොට සමන් වෙහෙර සහ සමන් දේවාලය විනාශ කොට ඒ මත බලකොටුවක් හා කතෝලික පල්ලියක් ද ඉදි කළහ[21]. එසේ විනාශ වූ ස්ථාන ලෙස සමන් වෙහෙර, සමන් දෙවොල, සමන් විහාරය හා සම්බන්ධ පිරිවෙණ, චෛත්‍යය, භික්ෂු නේවාසිකාගාරය ද තිබුණු බව අලගියවන්න මුකවෙටිතුමන්ගේ සැවුල් සන්දේශයේ[22] එකී ස්ථාන වර්ණනා කිරීමෙන් පෙනියයි. සීතාවක රාජ සිංහ රජුගේ කාලයේ සිට සෙංකඩගල දෙවන වන රාජසිංහ රජුගේ කාලය දක්වා සපරගමුවට අඳුරු කාල පරිච්ඡේදයක් පැවතුණි. එකල සමන් වෙහෙර බිමේ පරංගි බලකොටුව විය. දේවාලේගම සමන් වෙහෙර භූමියේ පිහිටි පරංගි පාලනය (පරංගින්ගේ සපරගමු දිසාවනිය) දෙවන රාජසිංහ රජුගේ උත්සාහයන් හා කහවත්තේ රණහැකරාළ සහ කුරුවිට කැඹිලියතරාළ ආදි යුද්ධ නායකයන්ගේ සහභාගිත්වයෙන් කළ ආක්‍රමණය නිසා අවසන් විය. දෙවන රාජසිංහ රජ (ක්‍රි.ව. 1634 –1684) සමයේදී මෙසේ පරංගී කොටුව බිඳ දමා සමන් වෙහෙර සහ

---

20 සීතාවකපුර යුගය 55 පිට

21 සපරගමු දර්ශනය 102 පිට

22 සැවුල් සංදේශය (පදය 165 - 184)

දෙවොල නැවත ඉදි කළද පළමු පැවති දියුණු තත්වයට පත් නොවූ බව පෙනේ. ඊට හේතුව නිරන්තර කැරළි කෝලාහල ආදියෙන් සපරගමුව අවුල්වී තිබීමය. දෙවන රාජසිංහගේ අවසන් කාලයේදී යළිත් මෙය පරංගි පහරදීමට ලක්ව විනාශ විය. ලන්දේසි පාලනය ඇරඹී පසුව දේවාලේගම පැවති දියුණුවක් ගැන අසන්නට නොලැබේ. ඉන් පසුව සපරගමුවේ ප්‍රධාන නගරය වන්නේ බටුගෙදර ය.

මායාදුන්නේ වර්ෂ 3 ක කාලයක් බටුගෙදර ස්වකීය පාලන මධ්‍යස්ථානය කර ගත් බව ඉහත දක්වා ඇත. පසු කාලයකදී පෘතුගීසීන් ද මෙහි බලකොටුවක් ඉදි කළ බවට සාධක තිබේ[23]. සමන් දේවාල භූමියට වඩා පැතිර පැවති පෙදෙසක් බටුගෙදරට අයත් විය. ගංවතුර තර්ජනය ද නොමැත. ඒ නිසා ලන්දේසි පාලන සමයේදී ද බටුගෙදර පාලන මධ්‍යස්ථානය වූයේය. එහෙත් උඩරට රජුන්ගේ මුල්කාලය තුළ සපරගමුවේ ඉතිහාසය අඳුරු ය. හත්වන රාජසිංහ රජුගේ කාලයේදී රචිත මන්දාරම්පුර පුවතේ "රත්නපුරය" ගැන සඳහන්වේ. ඇතැම් විට සපරගමුව වෙනුවට මෙම කාලය වන විට රත්නපුරය යයි ව්‍යවහාරයට පැමිණ තිබුණා විය හැක. රත්නපුරය ගැන එහි දැක්වෙන්නේද "මැණික්" ගැනය[24].

> රත්නපුරය නම් නව කෝරළය ද බුලත්ගම, හිතිදුම
> වෙල්ලස්සේ, කිවුලෙගෙදර, දියවානේ සහ විල්ගම
> මන්දාරම් පුරයෙහි විල්කඩ ද මැණික් ගඟ, රත්ගම
> සිව් සැත්තෑ මැණික් රුවන් ආකර කරවා මතරම

කෝට්ටේ හයවන පැරකුම් රජ දවස දිවයින කොටස් 12 කට බෙදා එක් එක් දිසාවට කොඩි තියම කළ බව ඉහත දක්වා ඇත. එසේ වුවද

---

23 උඩරට කැරැල්ල 34 පිට අ.දේ. සෝමරත්න

24 මන්දාරම්පුර පුවත

එම රජ සපරගමුව කිසිවකුට භාර නොකළේය. නමුත් උඩරට රජුන්ගේ කාලයේදි සපරගමුව පළමුවන අදිකාරම් වෙත භාර කිරිමේ සිරිත ඇරඹුණු බව කීර්ති ශ්‍රී රාජසිංහ රජු (ක්‍රි.ව. 1747 – 1780) හනුමන්කොඩි (ඇතැම් පොත්වල සවනක් කොඩි) අදිකාරමට පැවරිමෙන් පෙනේ. එසේ වුවද ප්‍රධාන අදිකාරම සපරගමුවේ නතරව සිටි බවට වාර්තා වී නැත. අන්තිම නායක්කර් රජ වූ ශ්‍රී වික්‍රම රාජසිංහ 1811 දි අධිපතියන් සමඟ ආරවුල් ඇති කර ගැනිමේ ප්‍රතිඵලයක් වශයෙන් එවකට ප්‍රධාන අදිකාරම් වූ ඇහැලේපොල නිළමේ සපරගමුවට පිටත් කර එවිය[26].

ඇහැලේපොල නිළමේ බටුගෙදර වෙනුවට රත්නපුරය සිය මධ්‍යස්ථානය කර ගත්තේය. ඔහු එහි සිට බටුගෙදර ඇළ වේලි ඉදි කොට කෘෂි කර්මාන්තයෙහි දියුණුවට කටයුතු කළේය. රත්නපුර සංවර්ධනය සඳහා ක්‍රියා කළ අවසාන සිංහල පාලකයා ද ඔහු විය. ඔහු දැනට ජාතික කෞතුකාගාරය පිහිටි තැන පැවැති තාවකාලික ලැහුම්හල ස්ථිර ගොඩනැගිල්ලක් බවට පත් කර ගති. 1815 දි ලක් දිව ඉංග්‍රිසින්ට අයත් විමෙන් පසුව ඔවුන් ආරක්ෂක කටයුතු සඳහා තෝරා ගත්තේ රත්නපුර නොව බටුගෙදරය. එහි සේවය කළ ප්‍රථම පාලකයා වූයේ පස්වන රයිපල් බලකායේ ලුතිනන් මැල්කම් ය[27]. 1818 කැරැල්ලෙන් ද පසුව ඉංග්‍රිසින් විසින් රත්නපුර නගරය පාලන මධ්‍යස්ථානය වශයෙන් තෝරා ගත්තේය. ඉංග්‍රිසින් දිවයින මුළුමනින්ම අල්ලා ගත් අලුතදි මෙහි සංචාරය කළ ජෝන් ඩේවි රත්නපුරය ගැන මෙසේ සඳහන් කරයි.

---

26 සංක්ෂිප්ත ලංකා ඉතිහාසය 178 පිට එච්.ඩබ්. කොඩ්රින්ටන්

27 ඓතිහාසික රත්නපුර 97 පිට

"රත්නපුරය මුරපොලකි. මේ කුඩා මුරපොලේ නිලධාරීන්ට <u>අතිපීසත්කාරපූර්වක</u> පිළිගැනීම් ගැන අපි ණය ගැති වෙමු. මුරපොල පිහිටියේ කළු ගඟේ දකුණු ඉවුරේ බිම් පොලක් මත ය. මෙය සාරවත් කුඩා තැනිවලින් ද සෝබන වශයෙන් ගැවසී ගත් හෙල්වලින් ද සෝබමාන සම්පන්න ලඳුවලින් ද වට වී තිබුණි. මෙහි පිහිටීම ද කිප අතකින් වැඩදායක විය. යාබද සාරවත් ප්‍රදේශ උෂ්ණ වුවද වෙසෙසින්ම සැපදායක දේශගුණයක් සහ මෙතෙක් විශාල ඔරුවලට යාත්‍රා කළ හැකි ගඟ ඉන් ප්‍රධාන ය. ගඟ දිගේ සැතපුම් භාගයක් පමණ පහළින් කුඩා පැල් විස්සක් තිහක් ද පරංගි කොටුවක නටබුන් මත ගොඩ නගනු ලද්දා වූ සපරගමුව අරක් ගත් දෙවියන් යයි සිතිය හැකි සමන් දෙවිඳුන්ට කැප කරන ලද තරමක් විශාල දේවාලයක් ඇති ගමක් ද ඇත්තේය[28]"

මෙම කෙටි විස්තරය අනුව පෙනී යන වැදගත්ම කරුණ නම් රත්නපුර නගරය රට ඉංග්‍රීසි ආධිපත්‍යයට යටත් වන විට බටුගෙදර හා දේවාලේගම තරම් වත් සංවර්ධනය වී නොතිබුණු බව ය. 1817 පත් වූ ලුතිනන් මැල්කම්ගේ සිට 1889 . හර්බට් මේස් දක්වා රත්නපුර දිස්ත්‍රික්කය පාලනය කළේ උප ඒජන්තවරයෙකු විසිනි. 1817 වන විට රත්නපුර පාලන මධ්‍යස්ථානයේ වැඩ අරඹා තිබූ බව දැනුදූ එහි ඇතුළු වන විටට පෙනෙන දොරටුවෙහි එකී වර්ෂය සටහන්ව තිබීමෙන් පෙනී යයි. උප ඒජන්තවරයෙකු වශයෙන් රත්නපුර දිස්ත්‍රික්කය පාලනය කළ ඔහු 1889 දී ප්‍රධාන ඒජන්ත බවට පත් විය. ඔහු රත්නපුර දිස්ත්‍රික්කයට කළ උසස් සේවය සළකා "මේස් අනුස්මරණ ශාලාව" නමින් දැනට තිබෙන පුස්තකාල ගොඩනැගිල්ල ආණ්ඩුව විසින් ඉදි කරන ලදී.

---

28 ඩේවි දුටු ලංකාව 26 පිට

# National Digitization Project

## *National Science Foundation*

Institute : Sabaragamuwa University of Sri Lanka

1. Place of Scanning : Sabaragamuwa University of Sri Lanka, Belihuloya
2. Date Scanned : 2017-10-02
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : S.A.C Sadaruwan

Signature : ..........................

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : LIBRARIAN

Name : T.N. NEIGHSOOREI

Signature : ..........................

Mrs. ... REI
Sab... of Sri Lanka
...anka

Date : 2017-10-02

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*